**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்**
**Sabaragamuwa Provincial Department of Education**

| | | |
|---|---|---|
| **දෙවන වාරය - අනාවරණ පරීක්ෂණය** | **2021** | **06 ශ්‍රේණිය** |
| **தவணைப் பரீட்சை** | **2021** | **தரம் – 06** |
| **Second Term - Diagnostic Test** | **2021** | **Grade 06** |

| | | |
|---|---|---|
| **භූගෝල විද්‍යාව** | **I, II** | **පැය දෙකයි** |
| **நிலவியல்** | **I, II** | **இரண்டு மணித்தியாலம்** |
| **Geography** | **I, II** | **Two hours** |

නම/විභාග අංකය :- ......................................

## පළමුවන කොටස

- **පහත සඳහන් සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

➢ **01 සිට 05 දක්වා ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. ශ්‍රී ලංකාවේ වැඩිම දිස්ත්‍රික්ක ප්‍රමාණයක් පිහිටි පළාත වන්නේ,
   1. උතුරු පළාත  2. උතුරු මැද පළාත  3. නැගෙනහිර පළාත  4. මධ්‍යම පළාත
2. කාලගුණික අංගයක් නොවන්නේ,
   1. මීදුම  2. වර්ෂාපතනය  3. උෂ්ණත්වය  4. මිලි මීටර්
3. ශ්‍රී ලංකාවේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පිහිටා තිබෙන්නේ,
   1. රත්නපුරයේය  2. රත්මලානේය  3. ගම්පහය  4. කොළඹ බෞද්ධාලෝක මාවත
4. උෂ්ණත්වය මනිනු ලබන්නේ,
   1. මිලි මීටර් වලිනි  2. සෙල්සියස් අංශක හෝ ෆැරන්හයිට් වලිනි
   3. අනිල මානයෙනි  4. නිරීක්ෂණයෙනි
5. පැදුරු කර්මාන්තයට ප්‍රසිද්ධ නගරයකි.
   1. පිළිමතලාව  2. මොරටුව  3. රදාවඩුන්න  4. දුම්බර

➢ **06 සිට 10 දක්වා ඇති ප්‍රශ්න වල '' අ '' කොටසට ගැලපෙන පිළිතුර '' ආ '' කොටසින් තෝරා යා කරන්න.**

| ''අ'' කොටස | ''ආ'' කොටස |
|---|---|
| 06. ජල වාෂ්ප ඝනීභවනය වීමෙන් | කදුවැටි |
| 07. සුළගේ වේගය මැනීම | වළාකුළු සෑදේ |
| 08. භෞතික භූ ලක්ෂණයකි | නිරීක්ෂණය මගිනි |
| 09. මිනිසා විසින් නිර්මිත භූ ලක්ෂණයකි | අනිල මානය |
| 10. වළාකුළු වල ස්වභාවය දැන ගන්නේ | මහා මාර්ග |

- **11 සිට 15 දක්වා ඇති ප්‍රශ්නවල වාක්‍ය නිවැරදි නම් ( √ ) ලකුණද වැරදි නම් ( × ) ලකුණද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.**

11. සුදු රෙදි හොරා සංචාරක පක්ෂියෙකි. ( )
12. ඉන්ධන ලබාදීම ශාක මගින් සිදු නොකරයි. ( )
13. ගස්වල බීජ ව්‍යාප්තියට බත්කුරා සහය වෙයි. ( )
14. ඇටිකුකුලා වගාවන්ට හානි කරන ගොළුබෙල්ලන් විනාශ කරයි. ( )
15. තැනිතලා ප්‍රදේශවල පොල් වගාව හොඳින් සිදුවේ. ( )

- **16 සිට 20 දක්වා ඇති ප්‍රශ්නවල හිස් තැනට සුදුසු පිළිතුර යටින් දී ඇති වරහන් තුලින් තෝරා හිස් තැනෙහි ලියන්න.**

16. සේවා කටයුතු අතර -------------------------- ඉතා වැදගත් වන සේවාවකි.

17. අම්බලන්ගොඩ -------------------------------- කර්මාන්තය සඳහා ප්‍රසිද්ධය.

18. ගෘහ ආශ්‍රිතව කරනු ලබන කුඩා පරිමාණ කර්මාන්තයකි ------------------------ .

19. තෙත් කලාපයෙහි වැවෙන බෝගයකි ------------------------- .

20. උතුරු පළාතේ -------------------------------- වගාව සාර්ථකව සිදු කරයි.

( දුම්කොල, ඇඳුම් මැසීම, අධ්‍යාපනය, වෙස් මුහුණු, ගම්මිරිස් )

( ලකුණු 2 × 20 = 40 )

## දෙවන කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 04 ට පිළිතුරු සපයන්න.**

1) සපයා ඇති ලංකා සිතියම උපයෝගි කර ගනිමින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

   I. ඔබේ පාසල පිහිටි පළාත තද වර්ණයකින් සේයා කරන්න (පාට කරන්න).

   II. ඔබ පාසල පිහිටි දිස්ත්‍රික්කය ඊ තලයකින් පෙන්වා නම් කරන්න.

   III. ඓතිහාසික පූජණීය ප්‍රදේශයක් වන අනුරාධපුර දිස්ත්‍රික්කය කහ පාටින් සේයා කර නම් කරන්න.

   IV. ශ්‍රී ලංකාවේ පිත්තල භාණ්ඩ වලට ප්‍රසිද්ධ ප්‍රදේශය අයත් වන දිස්ත්‍රික්කය රතු පාටින් සේයා කර නම් කරන්න.

   V. ශ්‍රී ලංකාවේ ලී බඩු කර්මාන්තයට ප්‍රසිද්ධ දිස්ත්‍රික්කය දුඹුරු පාටින් සේයා කර නම් කරන්න.




ලකුණු 4 × 5 = 20

2)

i. ඔබ පාසල පිහිටි කුඩාම පරිපාලන ඒකකය ලියන්න.
ii. ශ්‍රී ලංකාවේ විශාලතම පරිපාලන ඒකකය නම් කරන්න.
iii. ග්‍රාම නිළධාරි කොට්ඨාස කීපයක් එකතු වීමෙන් සැදෙන්නේ කිනම් පරිපාලන ඒකකයද?
iv. ඔබ පාසල පිහිටි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය නම් කරන්න.
v. ඔබේ පාසල අවට පිහිටි පොදු ස්ථාන 02ක් ලියා දක්වන්න.

( ලකුණු 2 × 5 = 10 )

3)

i. කාලගුණය යන්න හඳුන්වන්න.
ii. වර්ෂාව මගින් අපට ලැබෙන ප්‍රයෝජන 02 ක් ලියන්න.
iii. වර්ෂාපතනය මනින උපකරණය සහ වර්ෂාව මනින ඒකකය නම් කරන්න.
iv. සුළං හමන දිශාව පෙන්වන උපකරණය සහ සුළං මනින ඒකකය නම් කරන්න.
v. කාළගුණික තොරතුරු දැන ගැනීමෙන් ඇති ප්‍රයෝජන 02 ක් ලියන්න.

( ලකුණු 2 × 5 = 10 )

4)

i. ඔබ පාසල අවට ස්වභාවිකව නිර්මාණය වූ භූ ලක්‍ෂණ 02ක් සඳහන් කරන්න.
ii. චිත්‍රයක සහ කටු සිතියමක දැකිය හැකි පැහැදිලි වෙනස්කම් 2ක් ලියන්න.
iii. ශාක වලින් අපට ලැබෙන ප්‍රයෝජන 2ක් ලියන්න.
iv. වේයා සහ වවුලාගෙන් පරිසරයට ලැබෙන ප්‍රයෝජන 1 බැගින් ලියන්න.
v. ඵල හට ගැනීමට අවශ්‍ය පරාගණය කරන කෘමීන් දෙදෙනෙකු නම් කරන්න.

( ලකුණු 2 × 5 = 10 )

(5)

i. ඉස්ලාම් හා හින්දු ආගම් සම්බන්ධව උත්සව 1 බැගින් ලියන්න.
ii. ඔබ ප්‍රදේශයේ මිනිසුන්ගේ (ප්‍රජාවගේ) දියුණුව උදෙසා පිහිටුගෙන ඇති සමිති සමාගම් 2ක් ලියන්න.
iii. වෙරළ තීරය ආශ්‍රිත ජනයා සත්ත්ව පාලනය යටතේ ඇති කරන සතුන් වර්ග 2ක් නම් කරන්න.
iv. කැළණි ගං මිටියාවතේ කොරටු වගාව තුල වගා කරන පළා වර්ග 2 ක් ලියන්න.
v. ඔබගේ ගෙවත්තේ හෝ පාසැල් භූමියේ බෝග වගා කිරිමේදි ඔබට දායක විය හැකි අවස්ථා 2ක් ලියන්න.

( ලකුණු 2 × 5 = 10 )

(6)

i. ඔබ ප්‍රදේශයෙන් සපයා ගත හැකි අමුද්‍රව්‍ය යොදා ගෙන කරනු ලබන කර්මාන්ත 2ක් ලියන්න.

ii. උළු, ගඩොල් කර්මාන්තයට ප්‍රසිද්ධ ප්‍රදේශය සහ එම ප්‍රදේශය අයත් දිස්ත්‍රික්කය සඳහන් කරන්න.

iii. ඔබ ප්‍රදේශයේ පවත්නා විවිධ සේවාවන් 2ක් ලියන්න.

iv. පාසැල් සිසුවෙකු වශයෙන් ඔබ භුක්ති විඳින සේවාවන් 2ක් නම් කරන්න.

v. තැපැල් සේවාවෙන් ඉටු කරන කාර්යයන් 2ක් ලියන්න.

( ලකුණු 2 × 5 = 10 )